# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,743 — 1959 මැයි 15 වැනි සිකුරාදා—15.5.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)



| | | | පිට | | | | පිට |
|---|---|---|---|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු | ... | ... | 1143 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | | ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | ... | ... | 1151 | ආණ්ඩුවේ නොවන දැන්වීම් | ... | ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් | ... | ... | 1151 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | | ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | | ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම | ... | ... | — |
| බඩු බාහිරාදිය විකිණීම | ... | ... | — | විවිධ දැන්වීම් | ... | ... | — |



## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හි දී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාතීමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීනු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු සථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

1143—ජේ. ඇන්. බී 13706—6,304 (5/59)

**(iv)** සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේ ම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද ' යි සඳහන් කොට එවිය යුතු ය.

**(ii)** සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

**(iii)** කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

**(iv)** යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

**(v)** මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ලංකා යුධ හමුදව—සෙසු නිල පත්වීම්

මෙම නිවේදනයෙහි 4 වන ඡෙදයෙහි දක්වා තිබෙන, ලංකා යුධ හමුද නිත්‍ය බල සේනාවේ සෙසු නිල පත්වීම් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ :—

2. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම—

(අ) තමා ලාංකිකයෙක් බව ('' ලාංකික '' යනුවෙන් අදහස් කරනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් පුරවැසියෙකුවූ කෙනෙකි.)

(ආ) 1959 ජුනි මස 1 වෙනි දින වයස අවුරුදු 18ත් 40ත් අතර වූවෙකු බව, හා

(ඇ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි පස්වන පන්තිය සමත්කර ඇති අයෙකු බවද,

සතුටුදායක සාක්ෂි ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

ඉහත සඳහන් සුදුසුකම්වලට අමතර වශයෙන්—

(ඉ) යුධ හමුද ආඥපතිතුමාගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් නොවන, හෝ

(ඊ) අඩි 5 අඟල් 4ට අඩුවෙන් උස ඇති කිසිම කෙනෙකු යුධ හමුදවට බඳවාගනු නොලැබේ.

කෙසේවෙතත්, යුධ හමුද ආඥපතිතුමාගේ අනුමතිය ඇතිව, විශෙෂ අවස්ථාවලදී අවුරුදු 40ට වැඩිවන හෝ අඩි 5 අඟල් 4ට අඩුවෙන් උස ඇති හෝ නැතහොත් අවුරුදු 40ට වඩා වයස්වූද, අඩි 5 අඟල් 4ට අඩුවූ ද අය බඳවා ගත හැක.

3. මේ තනතුරු සඳහා ඉදිරිපත්වන සේවාමුක්ත භටයෙක් වේ නම්, ඉහතින් දක්වන ලද 2වන ඡෙදයෙහි සඳහන් සුදුසුකම්වලට අමතර වශයෙන්—

(1) තමා ලංකා ආරක්ෂක හමුදව ඇතුළුව, බ්‍රිතාන්‍ය පොදුරාජ්‍ය මණ්ඩලයේ යම් හමුදවක අවුරුද්දකට අඩු නොවන කාලයක් සේවයකර ඇති බවට, හා

(2) යුධ සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී චරිතය '' ඉතා හොඳ '' යයි වර්ගකර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. **විශෙෂ සුදුසුකම්.**—ඉහත සඳහන් ඡෙදයන්හි දක්වන ලද සුදුසුකම්වලට අමතර වශයෙන් පහත දක්වෙන තනතුරුවලට ඉදිරිපසින් දක්වා ඇති '' විශෙෂ සුදුසුකම් '' ඇති අයදුම් කරුවන් කෙරෙහි විශෙෂ සැළකිල්ලක් දක්වනු ලැබේ :—

| අංකය | ඒකකය | නිලය හා තනතුර | විශෙෂ සුදුසුකම |
|---|---|---|---|
| 1 | ලංකා යුධ හමුද සේවා බලකාය ... | සාජන් ලිපිකරු ... | (1) වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුයි<br>(2) වාණිජ විෂයයන් සහිතව ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨය සමත්කර සිටිය යුතුයි<br>(3) සිංහල ටයිප් ගැසීම සහිතව දක්ෂ ලඝු ලෙඛකයෙක් විය යුතුයි<br>(4) කාර්‍යාලයීය කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුයි |
| 2 | ලංකා යුධ හමුද සේවා බලකාය ... | කෝප්පරල් ලිපිකරු ... | (1) වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුයි<br>(2) වාණිජ විෂයයන් සහිතව ඉංග්‍රීසි කණිෂ්ඨය සමත්කර සිටිය යුතුයි<br>(3) වචන 25–30 දක්වා ඉංග්‍රීසියෙන් ටයිප්ගැසීමට සහ ඉංග්‍රීසි ලඝුලේඛනය සහ සිංහල ටයිප්ගැසීම පිළිබඳ දැනීමක් තිබිය යුතුයි<br>(4) කාර්‍යාලයීය කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුයි |
| 3 | ලංකා යුධ හමුද පොදු සේවා බලකාය... | සාජන් අධ්‍යාපන උපදේශක —පරිවර්තන කටයුතු සඳහා | (1) යටත්පිරිසෙයින් පහත සඳහන් සුදුසුකම්වලින් එකක්වත් තිබිය යුතුය :—<br>(1) ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨය සමග පුහුණුවූ සිංහල ගුරු සහතිකපත් දරණ අය<br>(2) ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨය සමග සිංහල ගුරු සහතිකපත් දරණ අය<br>(3) ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨය සමග සිංහල පොදු සහතිකපත්‍ර විභාගයේ උසස් පෙළ සහතික දරණ අය<br>(4) ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨයෙන් හා සිංහල ජ්‍යෙෂ්ඨයෙන් සමත්ව; යටත්පිරිසෙයින් අවුරුදු දෙකක කාලයක් ඉගැන්වීමේ හා පරිවර්තන කටයුතුවල පළ පුරුදු ඇති අය<br>සාමාන්‍ය විද්‍යාව සහ බීජ ගණිතයත්, ජ්‍යාමිතියත් සිංහලෙන් ඉගැන්වීමේ හැකියාව තිබෙන අය ගැන විශෙෂයෙන් සලකා බලනු ලැබේ. |

| අංකය | ඒකකය | නිලය හා තනතුර | විශෙෂ සුදුසුකම් |
|---|---|---|---|
| 4 | ලංකා යුධ හමුද පොදු සේවා බලකාය ... | ලාන්ස් කෝප්පරල්—හස්ත කර්මාන්ත උපදේශක | (1) පිළිගත් ආයතනයක හස්ත කර්මාන්ත පිළිබඳ පුහුණුවක් ලබා ඇති අය විය යුතුය<br>(2) යටත්පිරිසෙයින් පහත සඳහන් කර්මාන්ත වලින් තුනක් ඉගන්වීමටත් කිරීමටත් හැකිවිය යුතුය<br>(අ) වඩුවැඩ, (ආ) වේවැල් වැඩ, (ඇ) කොහු වැඩ, (ඈ) හම් වැඩ, (ඉ) පොත් බැඳීම<br>(3) ඉංග්‍රීසියෙන් වැඩ කිරීමේ හැකියාව තිබීම විශෙෂ සුදුසුකමක් හැටියට සළකනු ලැබේ |
| 5 | ලංකා යුධ හමුද පොදු සේවා බලකාය ... | ලාන්ස් කෝප්පරල් කෘෂිකර්ම ඕවර්සියර් | (1) කණිෂ්ඨය සමත්විය යුතුය<br>(2) ආණ්ඩුවේ කෘෂිකර්ම පාසැලකින් සහතික ලබා තිබිය යුතුය<br>(3) ආදර්ශ ගොවිපළක හෝ වත්තක වැඩකරුවන් පාලනය කිරීමේ හැකියාව තිබිය යුතුය<br>(4) සත්ව පාලනය ගැන පළපුරුද්දක් තිබිය යුතුය |
| 6 | ලංකා යුධ හමුද පොදු සේවා බලකාය ... | සාමාන්‍ය සෙබල ලිපිකරු ... | (1) යටත්පිරිසෙයින් සිංහල සහ ඉංග්‍රීසි කණිෂ්ඨය සමත් අය විය යුතුය<br>(2) යටත්පිරිසෙයින් විනාඩියකට සිංහල වචන 12ක් ටයිප් කළ හැකිවිය යුතුය<br>(3) විනාඩියකට සිංහල වචන 60ක් ලඝු ලේඛනය කළහැකි විය යුතුය<br>අතිරේක සුදුසුකම් වශයෙන් සිංහල ලඝු ලේඛන හා ටයිප්ගැසීම පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය |

**5. තෝරාගනු ලබන සැම ඉල්ලුම්කරුවෙක්ම, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශෙෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දනට පණවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පණවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියා කළ යුතුව තිබේ.**

**6. සවකීය දෙමාපියන්ගේ නැතහොත් භාරකාරතැනගේ කැමැත්ත ලියවිල්ලකින් ඉදිරිපත්කරනු නොලබන වයස 21ට අඩු කිසිම කෙනෙකු යුධ හමුදවේ නිත්‍ය බල සේනාවට බඳවාගනු නොලැබේ.**

7. **සේවා කාලය.**—අවුරුදු 12ක සේවය සඳහා බැඳෙන සොල්දදුවෙකු, මුල් අවුරුදු 5 නිත්‍ය බලසේනා ඒකකයක සහ ඉතිරි අවුරුදු 7 නිත්‍ය උප සේවා බල හමුදවේ සේවය සඳහා ඇතුළු වේ. මෙම කාල සීමාවෙන් පසු, ඔහු සේවයෙන් අස්කිරීමට ඉඩ තිබේ. කෙසේ වුවද, ඒකකයේ අණදෙන නිළධාරිතැනගේ නිර්දේශය උඩ, විශ්‍රාම වැටුපට හිමිවනතාක් කල් නිත්‍ය බල සේනා ඒකකයක සේවයකිරීමට ඔහුට ඉඩ ලැබේ.

8. **වැටුප් සහ අතිරේක දීමනා.**—දනට නිත්‍ය බල සේනාවේ " සෙසු නිල " දරන භටයින් සඳහා ගෙවනු ලබන වැටුප් සහ අතිරේක දීමනාදිය පහත සඳහන් වේ :—

(අ) හමුදවට බැඳීමේදී 31 දිනක මසකට වැටුප් සහ දීමනා—

| | | වැටුප | ජීවනාධාර මුදල | සළාක දීමනා | ලොන්ඩරි දීමනා | විවාහ දීමනා | ශුද්ධ පඩිය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| සාමාන්‍ය සෙබළ | අවිවාහක | 46 50 | 27 90 | — | — | — | 74 40 |
| | විවාහක | 46 50 | 27 90 | 79 67 | 3 99 | 25 0 | 183 06 |
| ලාන්ස් කෝප්පරල්, ලාන්ස් බොම්බඩියර් | අවිවාහක | 62 0 | 43 40 | — | — | — | 105 40 |
| | විවාහක | 62 0 | 43 40 | 79 67 | 3 99 | 25 0 | 214 06 |
| කොපරල් සහ බොම්බඩියර් | අවිවාහක | 93 0 | 49 60 | — | — | — | 142 60 |
| | විවාහක | 93 0 | 49 60 | 79 67 | 3 99 | 25 0 | 251 26 |
| සාජන් ... | අවිවාහක | 147 25 | 49 60 | — | — | — | 196 85 |
| | විවාහක | 147 25 | 49 60 | 79 67 | 3 99 | 37 50 | 318 01 |
| මාණ්ඩලික සාජන් | අවිවාහක | 170 50 | 49 60 | — | — | — | 220 10 |
| | විවාහක | 170 50 | 49 60 | 79 67 | 3 99 | 37 50 | 341 26 |
| බලලත් නිලධාරි 2 | අවිවාහක | 186 0 | 49 60 | — | — | — | 235 60 |
| | විවාහක | 186 0 | 49 60 | 79 67 | 3 99 | 40 0 | 359 26 |
| බලලත් නිලධාරි 1 | අවිවාහක | 217 0 | 49 60 | — | — | — | 266 60 |
| | විවාහක | 217 0 | 49 60 | 79 67 | 3 99 | 40 0 | 390 26 |

(ආ) අවිවාහක සොල්දදුවන් හට නිවාසයන්හි වෙසෙන බැවින් ඔවුනට සළාක දීමනා සහ ලෝන්ඩරි දීමනා ගෙවනු නොලැබේ.

9. **අයදුම් පත්‍ර පෝර්මය.**—ඉල්ලුම්පත්‍ර, මෙම ගැසට් නිවේදනය අන්තයෙහි දක්වා ඇති ආදර්ශය ඉල්ලුම්පත්‍ර පෝරමයේ අනුසාරයෙන් ඉල්ලුම්කරුවන් ගේ අත් අකුරින්ම ලියනලද ඒවා විය යුතුය. මුද්‍රණය කරන ලද, ටයිප් ගසන ලද හෝ ස්ටීරියෝ ටයිප් කරන ලද පෝරම පුරවා එවනු ලබන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

10. ඉල්ලුම් පත්‍ර ''යුද්ධ හටයින් බඳවන නිලධාරි තැන, යුධ හමුදා මූලස්ථානය, තැ.පෙ. අංක 553, කොළඹ'' යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයෙහිද, එය බහාලනු ලබන කවරය මතුපිටද ''ඉල්ලුම් පත්‍රය, නිත්‍ය බලසේනා සෙසු නිල පත්වීම් '' යන්න සඳහන් කළ යුතුය.

11. ඉල්ලුම් පත්‍ර 1959 ජූනි මස 1 වෙනි දින හෝ ඊට පෙර මෙම මූලස්ථානය වෙත ලැබිය යුතුය.

12. අයදුම්කරුවන් විසින් ඉල්ලා සිටින තනතුර සහ ඒකකය සඳහන් කළ යුතුය.

13. මොනම හේතුවක් නිසාවත්, අයදුම්කරුවන් වෙත අවශ්‍ය සුදුසුකම් නොමැති නම් ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

14. රජයේ සේවයේ යෙදී සිටින්නවුන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර, යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

15. ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ උප්පැන්න ලියාපදිංචි කර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය,

(ආ) තමා විසින් ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය, සහ

(ඇ) ඉල්ලුම් කරුවන් විසින් මෑතදී ලබාගන්නා ලද, තමාගේ සුදුසුකම්, චරිතය සහ තමා විසින් ඉල්ලා සිටිනු ලබන තනතුර සඳහා පත්කරගනු ලැබීම පිණිස යෝග්‍යතාවය පිළිබඳ සහතික තුනක්, ඉල්ලුම්කරු රක්ෂාවක නියුක්තව සිටින්නේ නම් මේ සහතිකවලින් එකක් තමාගේ වර්තමාන ස්වාමියාගෙන් විය යුතුය.

ඉහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවනු නොලබන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාරගනු නොලැබේ. මේ සහතිකපත්වල මුල් පිටපත් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු නොවේ. ඒවා ඉදිරිපත් කළ යුත්තේ ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබුවහොත් පමණකි.

16. යම්කිසි ඉල්ලුම්කරුවකු, ඔහු විසින් ඉල්ලුම් කරන ලද තනතුර සඳහා සුදුසුයයි තෝරාගනු ලැබුවහොත් ඔහුගේ වියදමින්ම, සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස නියම කරනු ලැබේ.

17. සම්මුඛ පරීක්ෂණය සහ අවශ්‍ය අනිකුත් පරීක්ෂණයන්ගෙන් පසු යුධ හමුදා පරීක්ෂක මණ්ඩලය මගින් නිත්‍ය බලසේනාවට පත්කර ගනු ලැබීම සඳහා තෝරාගනු ලබන ඉල්ලුම්කරුවකුට ඔහුගේ මේ පිළිබඳව තේරීමත්, යුධ හමුදාවට බඳවා ගැනීම සඳහා පැමිණිය යුතු දිනයත් ලියා දන්වනු ලැබේ.

18. අයදුම් කරුවකු රෙකමදාරු කෙරීමට කැමැති කෙනෙකුන් වේ නම් ඔහු විසින් යථෝක්ත අයදුම්කරුට සහතිකයක් දිය යුතුය. අයදුම්කරුවකුගේ තෝරා ගැනීම පිණිස දරණ අයථා ප්‍රයත්නයක් වේ නම්, ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ.

19. යම් අයදුම් කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම ඔහු තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ. තෝරා ගැනීමෙන් පසු අනාවරණය වූනි නම්, රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

කේ. රාජයෝගම්,
මේජර්,
යුධ හමුදා ආඥපතිතුමා වෙනුවට.

1959 මැයි මස 7 දින.

## යුධ හමුදා නිත්‍ය භට සේනාවේ සාමාන්‍ය සෙබළ තනතුරක් සඳහා ඉල්ලුම්පත්‍ර පෝරමය

(ඉල්ලුම්පත්‍රය ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම පිළියෙළකර පුරවන ලද්දක් විය යුතුයි)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) : ————.

2. (අ) පුද්ගලික ලිපිනය : ————.
(ආ) කාර්යාලයීය ලිපිනය : ————.

3. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) : ————.

4. ඉල්ලුම් කරන තනතුර : ————.

5. කලින් මෙවැනි තනතුරක් දැරුයේ නම්, දැරූ තනතුර සහ කාල පරිච්ඡේදය : ————.

6. කලින් දරණ ලද යුධ සේවාව පිළිබඳ විස්තර, තනතුරු සහ දින සහිතව : ————.

7. යුධ සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී චරිතය :————.
(යුධ සේවාවෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී ලබාගත් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

8. සමත්වූ උසස්ම පන්තිය (පාසැල් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) : ————.

9. ගැසට් නිවේදනයේ සඳහන් පරිදි මේ තනතුර සඳහා ඔබ වෙත සුදුසුකම් තිබේද ? ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර : ————.

10. දැනට ඔබ නියුතු රක්ෂාව : ————.

11. උස : අඩි ———— අඟල් ————.

12. සහතික ලබාගත් අය :—
(1) ————.
(2) ————.
(3) ————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ————.

අංකය : ජී. ඊ. බී. 5652.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ පාඨශාලාවල ශාරීරික අභ්‍යාස තනතුරු

රජයේ පාඨශාලාවල ශාරීරික අභ්‍යාස තනතුරු සඳහා (පිරිමි හා ගැහැණු) ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දී තිබෙන ආදර්ශ පෝරමය අනුව සකස් කරගත් ඉල්ලුම් පත්‍ර 1.6.59 වැනි දින හෝ ඊට කලින් කොළඹ 2, මලයි වීදියේ ජී. ඊ. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයා වෙත ලැබෙන පරිදි රෙජිස්තර තැපෑලෙන් එවිය යුතුය. "ඉල්ලුම් පත්‍රය—ශාරීරික අභ්‍යාස උපදේශක" යන්න ලියුම් කවරයේ මුදුන් වම් කෙළවර පැහැදිලිව ලියන ලද කවර තුළ බහා ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි.

**2. වැටුප් හා දීමනා.** දීමනා සහිත ව්‍යවස්ථානුකූල වැටුප් ක්‍රමය රු. 1,560—72×14—රු. 2,568 (කාර්යක්‍ෂම කඩඉම) රු. 2,640—120×5—රු. 3,340කි. කාර්යක්‍ෂමතා කඩඉඩමෙන් සමත්වීමට පෙර නිලධාරීන් විසින් මෙහි පහත සඳහන් ආවශ්‍යකතා තෘප්ත කළ යුතුයි :

(අ) **ස්වභාෂාවන්ගෙන් නිපුණත්වය ලැබිය යුතුයි. එනම් :—** ශාරීරිකාභ්‍යාස පන්තියෙන් හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අනික් ඕනෑම පන්තියක් සිංහලෙන්/දෙමළෙන් පැවැත්වීමේ පුළුවන්කම.

(ආ) අධ්‍යාපනාධ්‍යක්‍ෂ විසින් පිළිගනු ලැබූ ශාරීරිකාභ්‍යාස පාසැලක යටත් පිරිසෙයින් එක් අවුරුදු පුහුණුවක් ලැබීමෙන් පසු ශාරීරිකාභ්‍යාස සහතික පත්‍රයක් ලබාගත යුතුයි. එසේ නැත්නම්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන නේවාසික පාඩම් පන්ති දෙකකදී පුහුණුව ලබා සාර්ථකව සම්පූර්ණ කර, සහතික පත්‍ර ලබාගත යුතුය.

(ඉ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ශාරීරික අධ්‍යාපන (වාදය හා ප්‍රායෝගික වැඩ) විභාගයකදී විභාග කරුවන් තෘප්ත කළ යුතුයි.

**3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—**

(i) තනතුරු ස්ථිරය.

(ii) පිළිගත් සහතික පත්‍ර ලත් සාර්ථකවූ ඉල්ලුම්කරුවන් අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරන බවට නිශ්චය කරනු ලැබේ. තවද විශ්‍රාම වැටුප් සඳහා ඔවුන් පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් ක්‍රමයට හා ශික්‍ෂකයන්ගේ වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

(iii) පත් කරනු ලබන්නන් රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි සේවයේ නොසිටියේනම්, 3න් අවුරුදු ප්‍රවාසන කාලයකට යටත්ව පත් කරනු ලැබේ. රජය යටතේ දැනටම විශ්‍රාම වැටුප් හිමි පත්වීම් දරන්නන් පත් කිරීමේ දින සිට අවුරුද්දක් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ. එක් පාසැලකට පත් කරනු ලැබුවත්, ඒ අතර මණ්ඩලයේ අනිත් පාසැල්වලදී වැඩ කිරීමට උපදේශකයන්ට නියම කරන්නට පුළුවන.

**4. අවශ්‍ය සුදුසුකම්.—** සෑම ඉල්ලුම්කරුවකු විසින්ම මෙහි පහත සඳහන් කරණු ලබන කරණු පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) මේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අන්තිම දිනට වයස අවුරුදු 20ට අඩු හෝ 35ට වැඩි හෝ නොවිය යුතුයි. කවර හෝ යුධ සේවා කාල පරිච්ඡේදයක් සඳහා වයස් අනුග්‍රහයන්ට හිමිකම් පාන්නන් විසින් ඒ පිළිබඳ සෑහෙන පමණ සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

දැනට රජයේ සේවයේ නියුක්තව සිටින්නන් සම්බන්ධයෙන් ඌනෝක්ත කොන්දේසිය නොයෙදේ.

(ii) **ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්** (ඉංග්‍රීසි/සිංහල/දෙමළ) හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්වී සිටිය යුතුයි.

(iii) (අ) අධ්‍යාපනාධ්‍යක්‍ෂ විසින් පිළිගනු ලැබූ ශාරීරික අධ්‍යාපන පාඨශාලාවක යටත් පිරිසෙයින් අවුරුද්දක් පුහුණු වී ලබාගත් ශාරීරිකාභ්‍යාස සහතික පත්‍රයක් දැරිය යුතුය.

නො එසේ නම්,

(ආ) යුධ ශාරීරිකාභ්‍යාස පාඨශාලාවක ඔහු/ඇය සතුටුදායක තත්ත්වයක් ලද බව පෙන්වීමට සහතික පත්‍රයක්/පත්‍ර ලබා තිබිය යුතුය.

**නො එසේ නම්,**

(ඉ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද නේවාසික අභ්‍යාස පන්තියකට හෝ වැඩි ගණනකට පැමිණ, සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු, සහතික පත්‍ර ලබා සිටිය යුතුය.

නො එසේ නම්,

(ඊ) ක්‍රීඩා විෂයයෙහි අතිවිශේෂ ප්‍රවීණතා පිළිබඳ වාර්තාවක් ඇතුව ශාරීරික අධ්‍යාපනය ඉගැන්වීමෙහි අඩු ගණනේ 5 ක් අවුරුද්දක පළපුරුද්දක් ලැබ සිටිය යුතුය.

(iv) මනා සිංහල/දෙමළ දැනුමක් තිබිය යුතුය.

(v) හොඳ කල් ක්‍රියාවෙන් යුක්ත හා ශාරීරිකව සුදුසු විය යුතුය.

5. මෙහි පහත සඳහන් කරුණු පිළිබඳ ලියකියවිලිවල පිටපත් (මුල්පිටපත් නොවෙයි) ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න ලියා පදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ, උපකෘත පාඨශාලාවල කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ බාරගනු නො ලැබේ.)

(ආ) ශාස්ත්‍රීය හා වෘත්තීය සහතික පත්‍ර.

(ඉ) සිංහල/දෙමළ ප්‍රවීණතාව දක්වන සහතික.

(ඊ) ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම්, කල්ක්‍රියාව හා තනතුරට පත්කරනු ලැබීමට යෝග්‍යතාව පිළිබඳ මෑතදී ලබාගත් සහතික තුනක්. (දැනටම රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් විසින් මේ අනුඡේදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

**සංලක්‍ෂ්‍යය.**—(i) මෙකී සහතික පිටපත් හා චරිත සහතික පිටපත් ආපසු එවනු නො ලැබේ.

(ii) රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් චරිත සහතික පිටපත් එවීමෙන් පමණක් නිදහස් කරනු ලැබේ.

6. (අ) උපකෘත හෝ පිළිගනු ලැබූ ආධාර නොලබන පාඨශාලාවල සේවයේ නියුක්ත ශික්ෂකයන්ගේ ඉල්ලුම් පත්‍ර ඒ පාඨශාලාවල කළමනාකාරවරයන් මඟින් එවිය යුතුය. කළමනාකාරවරයන් ඒ ඉල්ලුම්කරුවන් සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන බව ලියා සඳහන්කර නැත්නම්, කවර තත්ත්වයක් යටතේවත්, ඒ ඉල්ලුම් පත්‍ර බාරගනු නො ලැබේ.

(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර නියමිත දිනට මේ කාර්යාලයට නොලැබුණහොත්, ඉල්ලුම් පත්‍රය නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානයා වෙත ලැබුන බවත් ප්‍රමාදයට හේතුත් දක්වා භාර ගැනීමට මැනවැයි නිර්දේශ කරන්නේ නම් පමණක් ඒ ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II වැනි ඡේදය පටන් ගැන්මේ ප්‍රසිද්ධ කර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන, සාමාන්‍ය කොන්දේසිද බලනු මැනවි. මෙම පළ කිරීමේ සඳහන් වූ නියමයන්ට අතිරේක වශයෙන් එම කොන්දේසි යෙදේ.

8. ඉල්ලුම් පත්‍ර හෝ ඒ පිළිබඳ අනික් ඕනෑම ලියකියමන් ජී. ඊ. ශාඛාවේ අධ්‍යාපනාධ්‍යක්‍ෂ වරයා වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ අනික් කිසිම නිලධාරියෙකු වෙත පෞද්ගලිකව නොඑවිය යුතුයි. මුද්‍රිත ඉල්ලුම් පත්‍ර මේ කාර්යාලයෙන් ලබාගත නොහැකියි. ඉල්ලුම් පත්‍ර ඉල්ලා එවන එබඳු ලියවිලි භාරගනු නොලැබේ. මෙහි පහත දී තිබෙන ආදර්ශ පෝරමය ඉල්ලුම් කරුවන් විසින් පිටපත් කරගත යුතුයි.

**9.** ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නො ලැබේ. සාමාන්‍ය තැපෑලෙන් එවනුලබන ඉල්ලුම් පත්‍ර නොලැබීම ගැන මේ කාර්යාලය වගකියනු නොලැබේ.

10. මෙම දැන්වීමේ වූ අවශ්‍යකතාවන් ට සෑම අයුරින් ම අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**එස්. එෆ්. ද සිල්වා,**
අධ්‍යාපනාධ්‍යක්ෂ.

1959 මැයි මස 12 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

**ජී. ඊ. බී. 5652.**

## ආදර්ශ පෝරමය

### ශාරීරික අභ්‍යාස උපදේශක තනතුරු පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම : මහත්මයා/මහත්මිය/මෙනවිය :————.
2. ලිපිනය :————.
3. (i) උපන් දිනය හා ස්ථානය :————.

   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

   (ii) වයස :————.
4. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම් කරුගේ පියා :————.

(ආ) ඉල්ලුම් කරුගේ පියාගේ පියා :————.

(ඉ) ඉල්ලුම් කරුගේ පියාගේ පියාගේත් පියා :————.

5. (අ) ඉල්ලුම් කරුගේ ජාතිය :————.

(ආ) ලාංකිකයකු නම්, ලියාපදිංචි කිරීමෙන් ද පරම්පරා වෙන් ද : ————.

6. දැනට රක්ෂාවක නියුක්ත නම් එය සේවා සටහන් සහිතව (ගුරුවරියකු නම්, ලියාපදිංචි කළ අංකය, දැන් ලබන වාර්ෂික වැටුප හා වැටුප් ක්‍රමය ආදිය සඳහන් කළ යුතුය.) : ————.

7. ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.

(i) සිංහල/දෙමළ :————.

(ii) ඉංග්‍රීසි :————.

8. ශාරීරික අධ්‍යාපන වෘත්තීය සුදුසුකම් (ආයතනයේ නම, පුහුණුව ලැබූ කාල පරිච්ඡෙදය හා ස්ථානය, සහතික පත්‍රයේ පන්තිය සහතික පත්‍ර පිටපතක් ඇමිණිය යුතුය.)

9. විශේෂ හිමිකම් හෝ සුදුසුකම් සහ/හෝ ශාරීරික අධ්‍යාපනයෙහි පල පුරුද්ද :————.

10. ඉල්ලුම්කරු යෙදුනු, විෂය මාලාවෙන් බාහිර, ක්‍රියාකාරීත්වයයන් පිළිබඳ සංක්ෂේප විස්තරයක් සහිතව අධ්‍යාපනය ලැබූ ස්ථානය :————.

11. චරිත සහතික ලබාගෙන තිබෙන තැනැත්තන්ගේ නම් සහ ලිපිනය :————.

————.
ඉල්ලුම් කරුගේ අත්සන.

දිනය :————.

---

## සවදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

### සවදේශීය ආරෝග්‍යශාලාවේ බාහිරාංශයෙහි වෛද්‍යවරයකු (සිද්ධ) සඳහා තනතුරක්

කොළඹ සවදේශීය ආරෝග්‍යශාලාවේ බාහිරාංශයෙහි (සිද්ධ) වෛද්‍ය වරයකු සඳහා වූ තනතුරකට ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ඉහත සඳහන් තනතුර සඳහා වූ සියළුම අයදුම්පත් 1959 ජූනි මස 2 වනදට හෝ ඊට පෙර කොළඹ 8, සවදේශීය වෛද්‍යක්‍රම සංවර්ධන කොමසාරිස්තුමාට ලැබෙන්නට එවිය යුතුයි.

3. වැටුප්.—මෙම තනතුරට අදාල වාර්ෂික වැටුප් ප්‍රමාණය රුපියල් 2,100—120 හා 180—4,080ක් වේ. කාර්යක්ෂමතා කඩඉම රුපියල් 2,760ට පෙර වනු ඇත.

4. **සේවාවේ කොන්දේසි.**—මෙම තනතුර සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගන්නා අයදුම්කරු පළමුකොටම තුන් අවුරුදු පරීක්ෂණ කාල පරිච්ඡෙදයකට යටත් වනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලංකාවෙහි හෝ ඉන්දියාවෙහි පිළිගත් වෛද්‍යායතනයකින් පිරිනමන ලද උපාධි සහතිකයක් ලබා සිටින්නවුන් විය යුතුය. එවැනි සුදුසුකම් ලැබීමෙන් පසු පස් වසකට නො අඩුවූ කාලයක් වෛද්‍යවරයකු වශයෙන් කාර්යයෙහි නිරතවී සිටියකු විය යුතුය ;

(ආ) යහපත් චරිතයකින් හා හොඳ ශරීරයක් ඇතියවුන් විය යුතුය ;

(ඉ) 1959 ජූනි මස 2 වනදාට වයස අවුරුදු 25ට නො අඩු, අවුරුදු 40ට නො වැඩි විය යුතුයි.

6. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. බව්තිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ) ;

(ආ) ලබාගත් උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතික පත්‍ර ;

(ඉ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක්. (රාජ්‍ය සේවයෙහි නියුක්තවූවනට මෙම උපවගන්තිය යටතේ සහතික පත්‍ර වුවමනා නොකෙරේ).

**සැලකිය යුතුයි.**—ඉහත සඳහන් සහතික පත්‍රාදියෙහි පිටපත් ආපසු නො එවනු ලැබේ.

7. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වන කොටසේ II ඡෙදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවාවේ තනතුරුවලට අදාලවන පොදු කොන්දේසි බලනු මැනැවි.

ඩබ්ලිව්. ජේ. ඒ. වැන්ලැන්ගන්බර්ග්,
සවදේශීය වෛද්‍යක්‍රම සංවර්ධන කොමසාරිස්.

1959 අප්‍රේල් මස 30 වනදා,
කොළඹ 8, සවදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේදීය.

---

## සවදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

### සවදේශීය වෛද්‍ය විද්‍යාලයයෙහි දේශීය විෂයයන් සඳහා වූ කථිකාචාර්ය (සිද්ධ) තනතුරක්

කොළඹ සවදේශීය වෛද්‍ය විද්‍යාලයයෙහි දේශීය විෂයයන් සඳහා වූ කථිකාචාර්ය (සිද්ධ) තනතුරකට ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ඉහත සඳහන් තනතුර සඳහා වූ සියළුම අයදුම්පත් 1959 ජූනි මස 2 වනදට හෝ ඊට පෙර කොළඹ 8, සවදේශීය වෛද්‍යක්‍රම සංවර්ධන කොමසාරිස්තුමාට ලැබෙන්නට එවිය යුතුයි.

3. වැටුප්.—මෙම තනතුර සඳහා රුපියල් 3,180න් පටන් ගෙන 120 වැඩිවීම් 6ක් හා රුපියල් 180 වැඩිවීම් 5ක් ද ඇතිව රුපියල් 4,800 දක්වා වැඩි වන වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය. කාර්යක්ෂමතා කඩඉම රුපියල් 3,900ට පෙර වනු ඇත.

4. **සේවාවේ කොන්දේසි.**—මෙම තනතුර සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. **තෝරා ගන්නා අයදුම්කරු පළමුකොටම තුන් අවුරුදු පරීක්ෂණ කාල පරිච්ඡෙදයකට යටත් වනු ඇත.**

**5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂකයකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—**

(අ) **ලංකාවෙහි හෝ ඉන්දියාවෙහි පිළිගත් වෛද්‍යායතනයකින්** පිරිනමන ලද උපාධි සහතිකයක් ලබා සිටින්නවුන් විය යුතුය. එවැනි සුදුසුකම් ලැබීමෙන් පසු දේශීය විෂයයන් ඉගැන්වීම පිළිබඳ පළපුරුද්දක් ලබා සිටිය යුතුය ;

(ආ) යහපත් චරිතයකින් හා හොඳ ශරීරයක් ඇතියවුන් විය යුතුය ;

(ඉ) 1959 ජූනි මස 2 වනදාට වයස අවුරුදු 25ට නො අඩු, අවුරුදු 40ට නො වැඩි විය යුතුයි.

6. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ) ;

(ආ) ලබාගත් උසස්ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතික පත්‍ර ;

(ඉ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක්. (රාජ්‍ය සේවයෙහි නියුක්තවූවනට මෙම උපවගන්තිය යටතේ සහතික පත්‍ර වුවමනා නොකෙරේ).

**සැලකිය යුතුයි.**—ඉහත සඳහන් සහතික පත්‍රාදියෙහි පිටපත් ආපසු නො එවනු ලැබේ.

7. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වන කොටසේ II වන ඡෙදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවාවේ තනතුරුවලට අදාලවන පොදු කොන්දේසි බලනු මැනැවි.

ඩබ්ලිව්. ජේ. ඒ. වැන්ලැන්ගන්බර්ග්,
සවදේශීය වෛද්‍යක්‍රම සංවර්ධන කොමසාරිස්.

1959 අප්‍රේල් මස 30 වනදා,
කොළඹ 8, සවදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේදීය.

---

## සවදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

### සාත්තු සේවිකා තනතුරු—සවදේශීය ආරෝග්‍යශාලාව

පුහුණු සහ නුපුහුණු සාත්තු සේවිකාවන් සඳහා බොරැල්ලේ කෝට්ටේ පාරේ රජයේ සවදේශීය ආරෝග්‍යශාලාව මෙයින් ඉල්ලුම් පත් කැඳවයි.

2. ඉල්ලුම් පත්‍ර 1959 ජූනි මස 2 වන දින දවල් 12ට පෙර පහත සඳහන් ආකෘති පත්‍රයන්හි පුරවා එවිය යුතු යි.

3. වැටුප් ක්‍රමය.

(අ) පුහුණු සාත්තු සේවිකාවෝ :— මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් රුපියල් 1,824න් පටන්ගෙන, වර්ෂයකට රුපියල් 72 බැගින් වැඩිවී රුපියල් 2,904 තෙක් වැඩිවේ. ජීවනාධාර මුදල, ඇපිල්ලුම් කුළී වශයෙන් රුපියල් 60ක් හා රුපියල් 20ක සපත්තු කුලී දීමනාවක් ද වාර්ෂිකව වේ. රජයේ නිවාසයක පදිංචිවී නැති නම් ගෙවල් කුළී දීමනාව ද ගෙවනු ලැබේ.

(ආ) නුපුහුණු සාත්තු සේවිකාවෝ :— මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් රුපියල් 1,338න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 42ක බැගින් වැඩිවී රුපියල් 1,824 තෙක් වැඩිවේ. ජීවනාධාර මුදල, ඇපිල්ලුම් කුලී වශයෙන් රුපියල් 60ක්, හා රුපියල් 20ක සපත්තු කුලී දීමනාවක් ද වාර්ෂිකව ගෙවනු ලැබේ. රජයේ නිවාසයක පදිංචි වී නැතිනම් ගෙවල් කුලී දීමනාව ද ගෙවනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම් :—**

(අ) පුහුණු සාත්තු සේවිකාවෝ :— සියළුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුය.

(1) 1959 ජූනි මස 2 වන දිනට වයස අවුරුදු 18ට නො අඩු අවුරුදු 35ට නො වැඩි විය යුතු ය.

(2) 1949 අංක 10 දරණ සෞඛ්‍ය (සංශෝධන) පනත යටතේ ලියාපදිංචි වූවකු විය යුතුය. සාත්තු සේවිකා කාර්යක්ෂමතා සහතිකයට අතිරේක වශයෙන් සූතිකර්මය ගැන සහතිකපත් ලද්දවුන් ගැන විශේෂයෙන් සැළකිලිමත් වනු ඇත.

(ආ) නුපුහුණු සාත්තු සේවිකාවෝ :— සියළුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුය.

(1) 1959 ජූනි මස 2 වන දිනට වයස අවුරුදු 18ට නො අඩු අවුරුදු 30ට නො වැඩි විය යුතුය.

(2) යටත් පිරිසෙයින් කණිෂ්ඨ පන්තියවත් සමර්ථව සිටිය යුතුය.

(3) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් පිරිනමන ලද කණිෂ්ඨ සාත්තු සේවක සහතිකය දරන්නවුන් හෝ, රජයේ හෝ වෙනත් පෞද්ගලික ආරෝග්‍යශාලාවක සේවය කොට සැළකිය යුතු පළපුරුද්දක් ඇති අය හෝ විය යුතුය.

**5. සේවයේ කොන්දේසි :—**

(අ) මේ තනතුරු ස්ථිරය.

(ආ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් සුළු කාලයකදී පත්වීම් භාර ගත යුතුයි.

6. අයදුම්කරුවන් පහත සඳහන් සහතික (පිටපත් පමණක්) තම ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුය.

(ආ) උප්පැන්න සහතික පත්‍රය (**සංලක්ෂ්‍යය.—බෞතිස්ම** සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවසථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික භාරගනු නො ලැබේ).

(ආ) මෑතකදී ලබා ගත් චරිත සහතික පත් 3ක්.

7. සියළුම අයදුම් පත් "සවදේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධන කොමසාරිස් තැන, සවදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව, කොළඹ 8" කියා එවිය යුතුයි. දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට නො එවිය යුතුයි.

8. මේ පිළිබඳව රජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ II වන ඡේදයේ සඳහන් පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලන්න.

වි. ජේ. ඇ. වැන් ලැන් ගන් බර්ග්,
සවදේශීය වෛද්‍යක්‍රම සංවර්ධන කොමසාරිස්.

සවදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව,
කෝට්ටේ පාර,
කොළඹ 8.
1959. 5. 11.

**ආදර්ශ ආකෘති පත්‍රය**

(1) සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

(2) ලිපිනය :————.

(3) උපන් දිනය හා අවුරුද්ද :————.
(උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි).

(4) ජාතිය :————.

(5) විවාහක අවිවාහක බව :————.
විවාහක නම්—
(අ) විවාහයට පළමු තිබූ නම :————,
(ආ) සවාමි පුරුෂයා ජීවත්ව සිටිනවාද ? :————.
(ඇ) 1. සවාමිපුරුෂයා සමග ජීවත් වනවාද ? :————.
2. නීතිප්‍රකාර වෙන් වී තිබේද ? :————.
3. එසේ නොමැතිව වෙන් වී සිටිනවාද ? :————.
4. සවාමිපුරුෂයාගේ රක්ෂාව ? :————.
5. ඔහු සේවය කරනුයේ කොහිද ? :————.
6. දරුවන්ගේ ගණන :————.
වැඩිමලාගේ වයස :————.
බාලයාගේ වයස :————.

6. දැනට සේවයේ යෙදී සිටින්නේ නම් :————.
(අ) ස්ථානය :————.
(ආ) කොතෙක් කල් සේවය කළේද ? :————.

(7) අධ්‍යාපනය ලත් පාසල් සහ සාමාර්ථය ලත් විභාග :————.

(8) සාත්තු සේවය පිළිබඳ අභ්‍යාස ලද්දේ කොහිදී ද ? :————.

(9) සූතිකර්මය පිළිබඳ අභ්‍යාස ලැබුවෙහිද ? ————.
(සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි).

(10) මෑතකදී ගන්නා ලද චරිත සහතික පත් 3ක් ඇමිණිය යුතුයි.

(11) පියාගේ හෝ භාරකාරයාගේ ලිපිනය :————.

(12) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පිළිබඳ දැනුම—

| | කියවීම | ලිවීම | කථාකිරීම |
|---|---|---|---|
| සිංහල | ............ | ............ | ............ |
| දෙමළ | ............ | ............ | ............ |
| ඉංග්‍රීසි | ............ | ............ | ............ |

(13) මීට පෙර රජයේ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(14) හෙදියන් වශයෙන් ලියාපදිංචි වී තිබේද ? :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)

(15) මීට පෙර රජයේ සේවයෙන් හෝ වෙනත් ආයතනයකින් හෝ අකාර්යක්ෂමතාවය උඩ විශ්‍රාම ගෙන හෝ සේවයෙන් පහ නොකළ බවත්, නීතිප්‍රකාර දඬුවම් නොලැබූ බවත්, මෙයින් සහතික කරමි. එමෙන් ම මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා ඇති බව ඔප්පු වුවහොත් වහාම මා සේවයෙන් පහකරන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පශු ශල්‍ය වෛද්‍යවරුන්ගේ තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශු ශල්‍ය වෛද්‍යවරුන්ගේ ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරුවලට අයත් වාර්ෂික වැටුප් පහත සඳහන් වේ:—

(1) අධිකාරි පත්‍ර (ඩිප්ලෝමා) හිමි අයට—

විශේෂ පන්තිය—රුපියල් 6,060 පටන්ගෙන වර්ෂයකට රුපියල් 240 බැගින් තුන් වරක් වැඩිවී රුපියල් 6,780 දක්වා ;

පළමු වැනි පන්තිය—රුපියල් 4,800 න් පටන් ගෙන වර්‍ෂයකට රුපියල් 180 බැගින් තුන් වරක් සහ රුපියල් 240 බැගින් දෙවරක් වැඩිවී රුපියල් 5,820 දක්වා ;

දෙවැනි පන්තිය—රුපියල් 1,620 න් පටන් ගෙන වර්‍ෂයකට රුපියල් 120 බැගින් 19 වරක් වැඩිවී සහ රුපියල් 180 බැගින් 4 වරක් වැඩිවී රුපියල් 4,620 දක්වා ;

(ii) ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය උපාධිධාරීන්ට—
රු. 4,080 න් පටන්ගෙන වර්‍ෂයකට රු. 360 බැගින් 12 වරක් හා වර්‍ෂයකට රු. 480 බැගින් 5 වරක් වැඩිවී රු. 10,800 දක්වා වැඩිවේ. රු. 8,400ට ඉහළින් යා හැක්කේ රජය විසින් පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුවය.

(iii) වෙනත් විශ්ව විද්‍යාලවල පශු වෛද්‍ය උපාධිධරයින්ට—
භාණ්ඩාගාරයේ උපදෙස් අනුව වැටුප් ප්‍රමාණය නියම කරනු ලැබේ.

3. සේවා කොන්දේසි : (i) මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම් කරුවන් අවුරුදු 3 ක් තුළ ආධුනිකත්වයේ තබනු ලැබේ.

(ii) තෝරා ගත් අයදුම්කරුවන් ක්ෂෙත්‍ර නිලධාරීන් වශයෙන් රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සහ ඉරිදා දිනවල සේවය කිරීමට බැඳී සිටිය යුතුය. එහෙත් එම දිනවල සේවයට අතිරේක ගාස්තුවක් හෝ නිවාඩුවක් ද දෙනු නොලැබේ.

(iii) තෝරා ගත් අයදුම්කරුවන් විසින් පත්වීම ලැබුණු දින සිට අවුරුදු 3 ක් ඇතුළතදී සේවයට පත් කොට යවන ප්‍රදේශයේ වැසියන් සමඟ මනාසේ කථා කිරීමට සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම ව්‍යක්ත භාවයක් ලබාගත යුතුයි.

4. අවශ්‍ය සුදුසුකම් :

සෑම අයදුම්කරුවකුම—

(අ) 1959 ජූනි 1 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු බවටත් අවුරුදු 35 ට නොවැඩි බවටත් ;

(ආ) පිළිගත් පශු වෛද්‍ය ආයතනයකින් උපාධියක් හෝ අධිකාරී (ඩිප්ලෝමා) පත්‍රයක් හෝ ලද්දකු බවටත් ;

(ඉ) තමා විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (ස. ල. බව්තිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාර ගනු නොලැබේ.)

(ආ) ලබාගත් උසස්ම අධ්‍යයන සහතික පත්‍රය හා සුදුසුකම් පිළිබඳ වෙනත් සහතික පත්‍ර ;

(ඉ) තම සුදුසුකම්, චරිතය මේ පත්වීමට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක පිටපත් (රාජ්‍ය සේවාවෙහි නියුතු අයදුම්කරුවන්ට මේ උප ඡේදය යටතේ සහතික පත්‍ර එවීමට නියම කරනු නොලැබේ.)

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි පළව ඇති රාජ්‍ය සේවාවහි තනතුරුවලට කරන පත්වීම් පිළිබඳ පොදු කොන්දේසි බලනු මැනවි.

7. මේ සඳහා ඉදිරිපත් කරන අයදුම් පත්‍ර පහත දක්වා ඇති අකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කොට 1959 ජූනි 1 වැනි දිනට හෝ ඊට පෙර, පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට ලැබෙන ලෙස රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. මේ සඳහා විශෙෂ අයදුම් පත් නොමැත. කිසිම අයදුම් පතක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට පුද්ගලික වශයෙන් නොඑවිය යුතුය.

ඇම් ආර්ප්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 මැයි 5 වැනි දින,
පේරාදෙණියේදී ය.

**පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශු ශල්‍ය වෛද්‍යවරුන්ගේ තනතුරට ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම:————.

2. ලිපිනය :————.

3. වයස සහ උපන් දිනය:————.
(1959 ජූනි 1 වැනි දිනට)

4. උපන් ස්ථානය:————.

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.

(ඉ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ :————.

(ඊ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තනුවන්ගේ : ————.

(අයදුම්කරු ලංකාවේ උපන්නෙහි නම් (අ) කොටස සමඟ, (ආ) හෝ (ඉ) සහ (ඊ) කොටස පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ උපන්නේ නැත්නම් (අ) කොටස සමග (ආ) සහ (ඉ) හෝ (ඉ) සහ (ඊ) කොටස පිරවිය යුතුය.)

5. අයදුම්කරු ලියාපදිංචි කිරීමෙන් හෝ පරම්පරාවෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් ද ? :————.

6. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්:————.

7. වෙනත් විශෙෂ සුදුසුකම්, ඇති කරන සත්තු ගැන සහ කෘෂිකර්මය ගැන පළපුරුද්ද :————.

8. දැනට කරන රැකියාවක් ඇතොත්, ඒ පිළිබඳ විස්තර :————.

9. කලින් කළ රැකියාවල් හා ඒ පිළිබඳ විස්තර :————.

10. චරිතය පිළිබඳව සහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

**ගොවිජනපද භාර නිලධාරි තනතුරු**

දෙවන ශ්‍රේණියේ ගොවිජනපද භාර නිලධාරි තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

**2. වැටුප් හා දීමනාවන් හා සේවය පිළිබඳ කොන්දේසි.**—මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

වාර්ෂික වැටුප් ක්‍රමය.—

| | | |
|---|---|---|
| දෙවන ශ්‍රේණිය | ... | රු. 1,380-120-3,780 |
| පළමුවෙනි ශ්‍රේණිය | ... | රු. 3,180-120-180-240-5,820. |

රජයේ රෙගුලාසි අනුව ජීවන වියදම සහ ගෙවල් කුලී ගෙවනු ලැබේ.

**3. අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්.**—අයදුම් කරුවෝ වයස අවුරුදු 20 ටත් 30 ටත් අතර ලාංකිකයෝ විය යුත්තාහ. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට වයස සීමාවක් නැත.

අයදුම්කරුවෝ —

(අ) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථය සහ

(ආ) (i) පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර ලද්දවුවන් හෝ

(ii) 1943 අංක 2 දරණ ආහාර නිෂ්පාදන (වතු) ආඥාපණත යටතේ පරීක්ෂකයකු වශයෙන් හෝ ආහාර නිෂ්පාදන නිලධාරියෙකු වශයෙන් හෝ අළුත් රබර් වැවීමේ ව්‍යාපාරය යටතේ දිස්ත්‍රික්කයක් හෝ තලාවක් භාර නිලධාරියෙකු වශයෙන් හෝ කෘෂිකර්ම කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති අය හෝ තේ, රබර් හෝ පොල් වැවීම සම්බන්ධයෙන් අක්කර 100 කට නොඅඩු වත්තක අවුරුදු 3 ක පළපුරුද්දක් ඇති අය විය යුතුය.

**4. සේවය පිළිබඳ කොන්දේසි.**— මෙම පත්වීම අවුරුදු 3 ක පරීක්ෂණාත්මක කාලයකට යටත් ය.

(අ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් තනතුරුවලට පත් කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ආ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් මෝටර් බයිසිකලයක් වැනි අනුමත කරන ලද වාහනයක් සපයා ගත යුතුය. රජයේ මුදල් රෙගුලාසි අනුව ඔවුන්ට ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

(ඇ) තෝරාගනු ලැබූ අයයුදුම්කරුවන් රු. 1,500 ක ඇපයක් තැබීමට සූදානම් විය යුතුය.

(ඈ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස දැනට පනවා ඇති නීති හා මින්මතු පණවන නීතිවලට ද විශේෂයෙන් 1956 අංක 33 දරණ රජයේ භාෂා පණතේ සඳහන් විධි විධාන ක්‍රියාත්මක කිරීමේ නීතිවලට ද තෝරාගනු ලැබූ අපේක්ෂකයින් බැඳී සිටිය යුතුය.

5. තම චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

6. නියමිත ෆෝර්මය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1959 මැයි මස 30 වැනි දිනට හෝ ඊට පෙර "ඉඩම් කොමසාරිස්, තැ. පෙ. 500, කොළඹ" කියා ලියාපදිංචි තැපැලෙන් මෙම කාර්‍යාලයට එවිය යුතුය. **නියමිත ෆෝර්මයට අනුව පිළියෙල නොකළ අයදුම් පත් භාරගනු නො ලැබේ.**

**7. අයදුම් පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.**

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළවූ ද රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්කිරීම් වලට අදාළ වූ ද පොදු කොන්දේසි බලන ලෙස ඉල්ලමි.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්.

1959 මැයි 8 වැනි දින,
කොළඹදී ය.

## අකෘති පත්‍රය

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව—ගොවි ජනපද භාර නිලධාරි තනතුරු**

1. සම්පූර්ණ නම, ජාතිය සහ ලිපිනය :————.

2. * උපන් දිනය සහ උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිනිය යුතුය) ————,

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පියා පාර්ශවයේ මුත්තාගේ :———.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තාගේ :———.

3. අධ්‍යාපනික සුදුසුකම් සමඟ වූ දිනය සහිතව :————. (සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය)

4. පාඨශාලාවෙන් අස්වූ දින සිට කරන ලද රක්ෂාවල් පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව දැනට ලැබෙන වේතනය හා වැටුප් ක්‍රමය :————.

5. කෘෂිකර්ම කටයුතු පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද :————. (වත්තෙහි බිම් ප්‍රමාණය සඳහන් කල සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුය)

6. යුධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳව විස්තර :———.

7. අමුණා ඇති සහතිකවල ගණන :————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳ දැනීමක් ඇත්තවුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයත්, ඔවුන්ගේ තනතුරුත් :———.

..................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* අයදුම්කරු ලංකාවේ ඉපදුනි නම් (අ) සමග (ආ) හා (ඇ) දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඉපදුනි නම් (අ) සමග (ආ)හෝ (ඇ) දෙක හෝ (ඇ) හා (ඈ) දෙකම පිරවිය යුතුය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජකීය විද්‍යාලයය—කොළඹ

### ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම පිළිබඳ අතිරේක විභාගය

විශ්ව විද්‍යාලීය ප්‍රවේශ විභාගයේ පිළිබඳ ප්‍රථම වර්ෂයේ කලා අංශයට ශිෂ්‍යයන් කීප දෙනෙකු තෝරා ගැනීම සඳහා විභාගයක් 1959 ජූනි මස 6 වෙනි දින රාජකීය විද්‍යාලයේදී පවත්වනු ලැබේ.

විද්‍යා අංශයට ශිෂ්‍යයන් ඇතුලත් කර ගැනීමට ඉඩක් නැත.

2. ඉල්ලුම් කරුවන්ගේ වයස 1.1.59 වැනි දිනට අවුරුදු 18 ට වැඩි නොවිය යුතුය. එමෙන්ම 1960 විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය උදෙසා තමන් විසින් තෝරාගත් අංශයට ඉදිරිපත් වීමට සුදුසුකම් වශයෙන් අවශ්‍යවූ සම්මාන සාමාර්ථයන් ඇතුළුව ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සාමාර්ථයය ලබා සිටිය යුතුය.

පෙරදිග භාෂා හා කලා අංශය—

(1) සම්මාන තුනක් ඇතුලුව විෂයයන් හයකින් සමත් විය යුතුය. ද්‍රවිඩ හෝ සිංහල භාෂාව අංක ගණිතය, වාණිජ අංක ගණිතය, මූලික ගණිතය හෝ ගණිතය, මේ විෂයයන් හයට ඇතුලත් විය යුතුය.

නීති අධ්‍යයන අංශය—

(2) (i) යටතේ දැක්වූ අවශ්‍යතාවනට ලතින් භාෂාවෙන් ලත් සාමාර්ථයක් ඇතුලත් විය යුතුය.

3. පහත සඳහන් විෂයයන් තෝරා ගන්නා ශිෂ්‍යයන්ට පමණක් ඉඩ කඩ සැලසිය හැකිය :—

සිංහල හෝ දෙමළ භාෂාව, ඉංග්‍රීසි, පාලි (සිං. මාධ්‍යමය)

සංස්කෘත (සිංහල/ලතින්/ආණ්ඩුක්‍රම, (සිං. දෙ. ඉං. මාධ්‍යම) ග්‍රීක්/භූගෝල ශාස්ත්‍රය (ඉං. දෙ. මාධ්‍යම)

ඉන්දියානු ඉතිහාසය (සිං. මාධ්‍යම) ලංකා ඉතිහාසය (සිං. දෙ. ඉං.)

යුරෝපීය ඉතිහාසය (සිං. දෙ. ඉං. මාධ්‍යම)

4. රෙජිස්ට්‍රාර් තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රයක ලියූ ඉල්ලුම් පත්‍ර 1959 මැයි 30 වැනි දිනට පෙර විද්‍යාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුය.

ඩබ්ලි. කේ. ජී. ද සිල්වා,
විද්‍යාලයාධිපති,
(රාජකීය විද්‍යාලයය.)

1959 මැයි 12 වැනි දින,
කොළඹ දී ය.

## පේරාදෙණියේ කෘෂිකම් පාඨශාලාවේ අවසාන විභාගයේ ප්‍රතිඵල—1959

1 වැනි පංතියේ සාමාර්ථ්‍යය :—

බී. ඇම්. අයි. ආර්. පී. මුල්ලේරියාව.

2 වැනි පන්තියේ සාමාර්ථ්‍යය :—

ඊ. ඇම්. එච්. ද සිල්වා, ටී. කනගසබේ, ඇන්. ඩබ්ලිව්. ජයසූරිය, ඇල්. බී. මයිකල්, ඇල්. එච්. ඇස්. පෙරේරා, ඇම්. ඇස්. ඇම්. මර්සූක්, සහෝදර මයිකල් රොබට්, සහෝදර ෆිලිප් ඔෆ් ජේසුස්.

සාමාන්‍ය පන්තියේ සාමාර්ථ්‍යය :—

සී. සී. උඩුමුල්ල, ඇස්. නඩරාජා, ඇම්. කන්දසාමි, ඩී. ඩී. වනසිංහ, ඇන්. බී. වරකාඋල්ල, ඇම්. බුලුමුල්ල, ඇෆ්. ආර්. විජේසිංහ, ටී. ඒ. තම්පිඅප්ප, පී. ඇම්. පොන්සේකා, ටී. ඇම්. පියරත්න, පී ඒ. විජේසේකර, ඇස්. බී. රූකව, බී. වී. ගුණසේකර, ඇස්. වී. ඊ. ප්‍රනාන්දු, සී. තිල්ලේගොඩ, ඇස්. ජයවර්ණ, ඇන්. බී. වීරසූරිය, ඩබ්ලිව්. ඩී. ඩබ්ලිව්. ජයවර්දන, ඕ. ඇම්. කේ. ආනන්ද, ඇල්. ඇල්. ආරියදාස, වී. සිවරත්නම්, ජී. කේ. තිබ්බොටුමුණුව, ඒ. ඇල්. ඩී. ප්‍රේමවර්දන, ඩී. පී. ද අල්විස්.

ඌන සාමාර්ථ්‍යය :—

උද්‍යාන විද්‍යාවෙන්—ඩබ්ලිව්. ඩබ්ලිව්. සෝමරත්න.
කෘෂිකර්මයෙන්—ඒ. ඇම්. ජමල් ඩීන්.
කෘෂිකර්මයෙන්—ජේ. ඇම්. බී. හේරත්.
තෘණ විද්‍යාවෙන්—ආර්. සීනිතම්බි.
තෘණ විද්‍යාවෙන්—ජේ. බී. හේරත්.
රසායන විද්‍යාවෙන්—ඇස්. නාගේස්වරන්.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (I. C. A.)

ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන් විසින් 1959 ජූලි 28 වැනි දින පෙරවරු 9.30 දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ජීවාන්තක පෝර (ඇමෝනියම් සල්ෆේට්) ටැන්ඩර් අංක 241, සැපයීම සඳහා ටැන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ටැන්ඩර් පෝර්ම ලබාගත හැක. ටැන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටැන්ඩර් කරුවන් විසින් ම තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 මැයි 12 වෙනි දින,
කොළඹ 1.

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (I. C. A.)

ගමනා ගමනය හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් 1959 ජූලි 29 වැනි දින පෙරවරු 9.30 දක්වා "විස්කොසිමීටර්" ආදී කරුණු 48 ක් (ටැන්ඩර් අංක 240) සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ටැන්ඩර් පෝර්ම ලබාගත හැක. ටැන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටැන්ඩර් කරුවන් විසින් ම තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 මැයි 12 වෙනි දින,
කොළඹ 1.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කන්තලේ රජයේ උක්වගාවේ සෑ. 8½ පමණ වැටකට දම්වැල් ගැසීම

කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කන්තලේ උක්වගාවේ සැතපුම් 8½ පමණ වැටකට දම්වැල් ගැසීම සඳහා ටෙන්ඩර පත්‍ර 1959 ජූනි 11 වැනි දින අපරභාග 2.30 වනතුරු භාරගනු ලැබේ.

2. කන්තලේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ටෙන්ඩර පෝර්ම ලබාගෙන ඒවායේ ටෙන්ඩර එවිය යුතුය. සෑම ටෙන්ඩරයක්ම ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති තුමා, ටෙන්ඩර මණ්ඩලය, කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශය, යුනියන් පෙදෙස, කොළඹ" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙලවරෙහි "කන්තලේ රජයේ උක්වගාවේ සැතපුම් 8½ පමණ වැටකට දම්වැල් ගැසීම සඳහා ටෙන්ඩර සැපයීම" යන්න ලියා එවිය යුතුය. සෑම ටෙන්ඩරයක්ම අනුපිටපතක් සමග විය යුතුයි.

3. ටෙන්ඩර පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර පත්‍රයක් වෙනුවෙන් රු. 50 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහ භාණ්ඩාගාරයේ හෝ කළ යුතුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බව දන්වා දින දහයක් ඇතුලතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට අතින්ම භාර දිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "කන්තලේ රජයේ උක් වගාවේ සෑ. 8½ පමණ වැටකට දම්වැල් ගැසීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත් ඔහු කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් වහාම ඒ ගැන විමසිය යුතුය.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට යට කී දිනයේ යටකී වේලාවේදී කොළඹ යුනියන් පෙදෙසේ කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ටෙන්ඩර් පෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතු වාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කරතොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

